# දහඅට සන්නියෙන් නිරූපිත රෝග නිවාරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

තුෂීර කේ.එස්., මධුෂාන් යූ.ඩී.එස්. සහ හර්ෂණ පී.එල්.සී.

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
shehanthushira@gmail.com

**සාරසංක්ෂේපය**

දහඅට සන්නියෙන් නිරූපිත රෝග නිවාරණ ක්‍රම පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. රෝග නිවාරණය විෂයෙහි දහඅට සන්නිය මගින් සිදු කළ බලපෑම කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. දහඅට සන්නිය රෝග නිවාරණය සඳහා සිදු කළ බලපෑම හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යයනය හා බුලත්සිංහල ප්‍රදේශයේ කේ.එස් ප්‍රේමලාල් මහතාගේ නිවසේ සිදු කළ ක්ෂේත්‍ර අධ්‍යනය සිදු වූ අතර, එහිදී ලබා ගත් කරුණු ඔස්සේ ප්‍රස්තුතය විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡාවට බඳුන්කිරීම මෙහි අධ්‍යයන ක්‍රමවේදයයි. දහඅට සන්නිය තුළ අන්තර්ගත 'අමුක්කු සන්නියෙන්' වමනය ඇති කරවන අමාශගත රෝග සඳහා ප්‍රතිකාර කෙරේ. 'අභූත සන්නියෙන්' බැල්මක් රහිත මානසික (උන්මාදය) රෝගය සඳහා ප්‍රතිකාර කෙරේ. 'භූත සන්නිය' භූත බැල්මක් සහිත උන්මාදය සඳහා ප්‍රතිකාර ලබා දේ. 'බිහිරි සන්නිය' බිහිරි බවට ප්‍රතිකාර ලබා දේ. 'දේව සන්නිය' මගින් දෙවියන්ගේ ලෙඩ නමින් හඳුන්වන වසංගත රෝග සඳහා ප්‍රතිකාර කෙරේ. දේව සන්නිය ඉදිරිපත් කිරීමට පෙර දොළොස් පාලියෙන් වසංගත රෝග පැතිරීමට ඇතිවන විෂබීජ නාශනය කිරීම සිදු කෙරේ. 'ගෙඩි සන්නිය' මගින් සැරව බිබිලි, චර්ම රෝග සඳහා ශාන්තිය ලබා දෙයි. 'ගිනි ජාලා සන්නිය' අධික උණ සහ සිරුර ඉදිමීමට මෙමගින් ප්‍රතිකාර කෙරේ. 'ගොළු සන්නිය' ගොළු බව නිරූපණය කරන මෙම සන්නිය සඳහා යොදා ගන්නා වෙස් මුහුණේ දිවක් නිර්මාණය කර නොමැත. 'ගුල්ම සන්නිය' මගින් නිරූපණය කරනුයේ පරපෝෂිත පණුරෝග හා ආමාශයික රෝගයන් ය. පණුරෝග නිසා ඇති වන ලේ හිඟකම දැක්වීම සඳහා වෙස් මුහුණට සුදුමැලි ස්වභාවයක් ආරෝපණය කෙරේ. 'ජල සන්නිය' ජලය මගින් බෝවන කොළරාව වැනි රෝගයන් මෙමගින් නිරූපණය කෙරේ. මෙහි 'කණ සන්නියෙන්' දැක්වෙන්නේ අන්ධ භාවයයි. 'කොර සන්නිය' මගින් කොර බව, අංශභාගය, අප්‍රාණික බව විදහා දක්වයි. මෙහිදී භාවිතා කරනු ලබන වෙස් මුහුණ මගින් අංශභාග රෝගය වැලඳීමෙන් පසු මුහුණෙන් එක් පැත්තක් ඇදවීම නිරූපණය කෙරේ. 'මරු සන්නිය' මානසික විපරීත භාවය පිළිබිඹු කෙරේ. 'නාග සන්නියෙන්' සර්පයන් සිහිනයෙන් දැකීම සහ නපුරු සිහින පෙනීම වැනි තත්වයන් නිරූපිතය. 'පිස්සු සන්නිය' උමතු බව පතුරාලන රෝගයකි. තාවකාලික උන්මාදය ප්‍රතිකාර කිරීම මෙමගින් අපේක්ෂා කරයි. 'පිත් සන්නිය' මෙහි මූලික ලක්ෂණය වන්නේ බඩේ අමාරුව ඇතිවීම හා වමනේ යාමයි. නිරූපණය කිරීමේ දී නැට්ටුවා දක්වන ඉරියව්වලට ගැලපෙන සේ වෙස් මුහුණ නිර්මාණය කර තිබේ. 'ශ්ලේෂ්ම සන්නිය' මගින් දැක්වෙන්නේ සෙම හා අපස්මාරය වැනි රෝගයන් ය . 'වාත සන්නිය' වාතය නිසා ඇති වන රෝ සඳහා මින් ප්‍රතිකාර කෙරේ. එනිසා රෝග නිවාරණ විෂයෙහි උපයෝගීතාව උදෙසා දහඅට සන්නිය භාවිතා කර ඇත.

**ප්‍රමුඛ පදඃ** *අමාශගත, උන්මාදය, වසංගත, ආමාශයික, අංශභාගය*